# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.10.01

නිලංජනී දිල්රුක්ෂි ගීගනගේ මිය,

නො. 322/ඊ, හැදෙණිය,

වැරුල්ලගම.

පැමිණිලිකාර පාර්ශවය

ප්‍ර.පො.ප.කුලසේන

ස්ථානාධිපති, විවිධ පැමිණිලි අංශය,

පොලිස් ස්ථානය, කටුගස්තොට.

වගඋත්තරකාර පාර්ශවය

**<u>පැමිණිලි අංකය : HRC/K/270/21</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

ඉහත නම් සඳහන් පැමිණිලිකාර පාර්ශවය විසින් 2021.07.26 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2021.06.14 වන දින තම අසනීප තත්ත්වයක් හේතුවෙන් බෙහෙත් ගැනීම සඳහා නුවරට යාමට අවශ්‍ය වූ බවත්, ඒ සඳහා තම දරුවා ද රැගෙන යාමට අපහසු වූ බැවින්, තමාගේ අවු.7ක් වයැසැති ලොකු පුතා තම ස්වාමි පුරුෂයා සිටින මහගෙදර රඳවා තබා යාමට එම නිවස වෙත ගිය අවස්ථාවේ දී ස්වාමි පුරුෂයාගේ මව (නැන්දම්මා) විසින් තමාට බැණ වැදී කිරි තේ කොප්පයකින් පහරදුන් බවත්, ඒ අවස්ථාවේ තමාගේ දැස් නොපෙනී ගිය බවත්, තවදුරටත් පහර දෙනු ඇති බවට වූ බිය නිසා තමා ස්වාමි පුරුෂයාගේ මව (නැන්දම්මා) තල්ලුකර දමා පැනගිය බවත් ය.

එම කාල වකවානුවේදී රටේ සංචරණ සීමා පනවා තිබීම හේතුවෙන් සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් ගලගෙදර පොලිස් ස්ථානය වෙත පැමිණිලි කිරීම සඳහා යාමට එදින තමාට අවස්ථාවක් නොතිබුණු බැවින් 2021.06.17 වන දින සීඅයිබී 1 102/86 යටතේ ගලගෙදර පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කළ බවත්, එහෙත් මෙම සිදුවීම සිදු වූ දිනම එනම්, 2021.06.14 දින තම ස්වාමි පුරුෂයාගේ පවුලේ අය කටුගස්තොට පොලිස් ස්ථානයට ගොස් පැමිණිලි කර තිබූ බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර

ඇත. එම පැමිණිල්ල තම බල ප්‍රදේශයට අයත් නොවන බව කටුගස්තොට පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් දැන දැනම හිතවත්කම් නිසාම 2021.06.16 දින කටුගස්තොට පොලිස් ස්ථානයේදීම එකී පැමිණිල්ල විභාගයට ගන්නා ලද බවත්, එම අවස්ථාවේදී පැමිණිලි විභාගය සිදු කරන ලද කුලසේන නැමති නිලධාරියාට තමා විසින් දිගින් දිගටම මෙම සිදුවීම සිදු වූ ස්ථානය කටුගස්තොට පොලිස් ස්ථානයට අයිති නොමැති බවත්, එය ගලගෙදර පොලිස් ස්ථානයට අයත් බවත් පැවසුව ද ඒ කිසිත් නොසලකා හැර පක්ෂග්‍රාහි ලෙස පැමිණිල්ල විභාග කළ බවත්, අනතුරුව තමාගේ අවු.3 වයසැති දියණිය සමඟ සවස 3.00 පමණ වනතෙක් පොලිස් ස්ථානයේ තබාගන්නා ලද බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

එම පැමිණිලි විභාගය සිදු වූ අවස්ථාවේදි තමාගේ ස්වාමි පුරුෂයාගේ සහෝදරයකු වන මහේෂ් මධුසංඛ යන අය පොලිස් නිලධාරීන් ඉදිරියේ තමාට පරුෂ වචනයෙන් බැණවැදි මරණ තර්ජනය කළ බවත්, ඔහු මෙම පැමිණිල්ලට අදාළ නොමැති අයෙකු බව තමා පොලිස් නිලධාරීන් හට දැනුම් දුන්න ද, ඔහුව ද එම ස්ථානයේ තබාගෙන පැමිණිලි විභාගය හිතවත්කම් මත සිදුකරන ලද බවත් පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එසේම, තමාට උණුවතුරෙන් පහරදුන් තම ස්වාමි පුරුෂයාගේ මව රිමාන්ඩ් නොකර තමාට මානසිකව හා වාචිකව පීඩනයක් ලබාදී පක්ෂග්‍රාහි ලෙස කටුගස්තොට පොලිස් ස්ථානයේ කුලසේන නැමති නිලධාරියා විසින් පැමිණිලි විභාගය පවත්වා තම දියණිය සමඟ තමා සවස් වනතුරු පොලිස් ස්ථානයේ රඳවා ගත් බැවින් ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටුකර දෙන ලෙස පැමිණිලිකාරිය මෙම පැමිණිල්ල මගින් ඉල්ලා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර ප්‍රධාන පොලිස් පරීක්ෂක කුලසේන නිලධාරියා විසින් 2022.02.28 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන නිලංජනී දිල්රුක්ෂි ගීගනගේ යන අයට එරෙහිව ඇයගේ ස්වාමි පුරුෂයාගේ මව විසින් කටුගස්තොට පොලිස් ස්ථානය වෙත ගොනු කරන ලද පැමිණිල්ලට අදාළ විභාගය සඳහා පොලිස් ස්ථානය වෙත 2021.06.16 වන දින පැමිණි අවස්ථාවේ දී අදාළ සිදුවීම සිදු වූ ස්ථානය ගලගෙදර පොලිස් බල ප්‍රදේශයට අයත් බව නොපැවසූ බවත්, කෙසේවෙතත් පසුව සිදුකරන ලද දැනුම් දීම මත එකී පොලිස් ස්ථානය වෙත අදාළ පැමිණිල්ල යොමු කළ බවත් ය.

එසේම, 2021.06.16 වන දින පැවති පැමිණිලි විභාගය සඳහා කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කර ඇති පැමිණිලිකාර නිලංජනී දිල්රුක්ෂි ගීගනගේ යන අයගේ ස්වාමි පුරුෂයාගේ සහෝදරයා හට සහභාගී වීමට ඉඩ සැලසීම තමා අතින් සිදු වූ වරදක් බවට පිළිගන්නා බව ද වගඋත්තරකාර ප්‍රධාන පොලිස් පරීක්ෂක කුලසේන නිලධාරියා විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. තවද, කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කර ඇති පැමිණිලිකාර නිලංජනී දිල්රුක්ෂි ගීගනගේ යන අය සහ ඇයගේ ස්වාමි පුරුෂයාගේ මව (නැන්දම්මා) අතර දිගින් දිගටම

ආරවුල් ඇති වීම හේතුවෙන් මෙම දෙපාර්ශවයට එරෙහිව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 81 වගන්තිය යටතේ නඩු ගොනු කළ බවත් වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළව කටුගස්තොට පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.ඩබ්.එස්. උදයසිරි මහතා විසින් අංක 4062/2021 සහ 2021.08.05 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2021.06.14 වන දින අංක 322/ඊ හැදෙණිය, වැරැල්ලගම ලිපිනයේ පදිංචි හපන්ගේ අයිරාංගනි තිලකා පද්මිණී ජයවර්ධන යන අය විසින් තම ලේලිය පහරදීමක් සිදුකළ බවට කටුගස්තොට පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් කර ඇති බවත්, එම පැමිණිල්ලේ පැමිණිලිකාරියගේ පුතාවන ශ්‍යාමන් මධුසංඛ යන අය හා ඔහුගේ බිරිඳ වන නිලංගනී දිල්රුක්ෂි යන අය අතර ඇති වූ ගැටළු හේතුවෙන් ඔවුන් දෙදෙනා වෙන්ව ජීවත් වන බවත්, පුතාගේ බිරිඳ විසින් තම පුතා තමාගේ ගෙදර සිටින අවස්ථාවේ නිවසට පැමිණ හේතුවක් නොමැතිව තමාට පහරදුන් බවත්, තමාට රෝහල්ගත වීමට අවශ්‍ය නොවන බවත්, මින් ඉදිරියට තමාට කරදරයක් නොකරන ලෙසට අවවාද කරන ලෙසත් සඳහන් කරමින් සීඅයිබී (3) 332/132 යටතේ පැමිණිල්ලක් කර ඇති බවත්, එය එම්සීආර් 2169/2021 ලේඛනයට ඇතුළත් කර විවිධ පැමිණිලි අංශය යටතේ විමර්ශන සිදුකරන ලද බවත් ය.

2021.06.15 දින විවිධ පැමිණිලි අංශයට අනුයුක්ත පො.කො.85488 කුමාර නිලධාරියා විසින් ඉහත පැමිණිල්ලට අදාළව වැඩිදුර විමර්ශන කටයුතු සිදුකර ඇති අතර, පැමිණිල්ල කර තිබූ පද්මිණී ජයවර්ධන යන අය හමුවී තොරතුරු ලබාගෙන වගඋත්තරකාර පැමිණිලිකාරියගේ ලේලිය වන නිලංජනී දිල්රුක්ෂි යන අය ද හමුවී පැමිණිල්ල විභාගය සඳහා 2021.06.16 දින පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දෙපාර්ශවය දැනුවත් කර ඇති බවත් සඳහන් කර ඇත.

2021.06.14 දින කරන ලද පැමිණිල්ලට අදාළ විමර්ශනය සඳහා 2021.06.16 දින කටුගස්තොට පොලිස් ස්ථානය වෙත පැමිණි අවස්ථාවේදී පැමිණිල්ල කර තිබූ පද්මිණී ජයවර්ධන යන අය තම ලේලිය විසින් කළ පහරදීම සම්බන්ධයෙන් තමාට රෝහල්ගත වීමට අවශ්‍ය බවත්, එම පැමිණිල්ලට අදාළව නීතිමය පියවර අවශ්‍ය බවත් ප්‍රකාශ කිරීමෙන් පසු විවිධ පැමිණිලි අංශයේ පො.කො.29172 විජේවීර නිලධාරියා විසින් පද්මිණී ජයවර්ධන යන අය වෙත අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයක් නිකුත් කර ඇති බවත්, අනතුරුව පැමිණිල්ලේ වගඋත්තරකාරිය වන නිලංජනි දිල්රුක්ෂි යන අයට පැමිණිල්ලේ චෝදනාව පැහැදිලි කර දී පැය 11.00ට විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. කුලසේන නිලධාරියා විසින් අත්අඩංගුවට ගෙන ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති බවත් වගඋත්තරකරු සිය වාර්තාව මගින් දක්වා ඇත. එසේම, එම පැමිණිල්ල සමථ මුල මණ්ඩලයට යොමු කරන බවත්, සමථ මුල මණ්ඩලය මගින් කැඳවන දිනයක පෙනී සිටින ලෙසත් විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති උපදෙස් ලබාදී සී.අයි.බී. (3) 369/158 යටතේ ඇතුළත් කර ඇති බවත් දක්වා ඇත.

තවද, එදිනම එනම්, 2021.06.16 වන දින පැය 12.20 ට ඉහත කී පැමිණිල්ලේ වගඋත්තරකාරිය වන නිලංජනී දිල්රුක්ෂි යන අයගෙන් ප්‍රකාශ සටහන් කරගත් බවත්, එහිදී "තමාට ඇති චෝදනා

පිළිනොගන්නා බවත්, තමාගේ නැන්දම්මා තම සැමියාට තමා වෙත ඒමට ඉඩ ලබා නොදෙමින් ඔහු මහගෙදර රඳවා ගෙන සිටින බවත්, එදින තමා සැමියාට තම දරුවා භාරදුන් අවස්ථාවේ නැන්දම්මා තේ කෝප්පයකින් තමාට ගැසූ බවත්, පසුව තමා ඇයව තල්ලු කර දැමූ බවත්, තේ වතුර වැටුනු පසු ඇස්දෙක නොපෙනී ගිය බැවින් තමාට තව පහරදීමට ඉඩඇති බැවින් ඇය තල්ලු කළ බවත්, තමා විසින් ඇයට පහරදීමක් සිදුනොකළ බවත්" ප්‍රකාශ කර ඇති බවත්, පැමිණිල්ල ගලගෙදර බල ප්‍රදේශයට අයත් බවක් වගඋත්තරකාරිය වන නිලංජනී දිල්රුක්ෂි යන් අය සඳහන් නොකළ බවත් දක්වා ඇත.

ඉන්පසු 2021.06.16 වන දින පැය 13.55 ට නිලංජනි දිල්රුක්ෂි යන අයට සමථ මුල මණ්ඩලයට පෙනී සිටින ලෙස උපදෙස් ලබාදී ඇප මත මුදාහැර ඇති බවත්, එය සීඅයිබී (4) 175/115 සටහන් යොදා ඇති බවත්, 2021.07.01 දින ඉහත පැමිණිල්ලට අදාළ සිදුවීම සිදුවූ ස්ථානය ගලගෙදර පොලිස් බල ප්‍රදේශයට අයත් ස්ථානයක් බව කරුණු අනාවරණය වීමෙන් පසු මෙම පැමිණිල්ලට අදාළ ඉදිරි නීතිමය පියවර ගැනීම සඳහා ගලගෙදර පොලිස් ස්ථානය වෙත යොමු කර ඇති බවත් දක්වා ඇත.

<u>පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වී ඇති කරුණු</u>

අංක 182/5, සාදික්කා කන්ද, වැරැල්ලගම යන ලිපිනයේ පිහිටා ඇති නිවසේදී 2021.06.14 දින පෙ.ව. 10.00ට පමණ මෙම පැමිණිල්ලේ පැමිණිලිකාර නිලංජනි දිල්රුක්ෂි ගීගනගේ හා ඇයගේ ස්වාමි පුරුෂයාගේ මව (නැන්දම්මා) වන එච්.එල්.ටී.පද්මිණි ජයවර්ධන යන අය අතර ආරවුලක් සිදුවී ඇති අතර, අදාළ නිවස පිහිටා ඇති ස්ථානය ගලගෙදර පොලිස් වසමට අයත් වන්නකි. පැමිණිලිකාරිය පදිංචි අංක 322ඊ, හැදෙණිය, වැරැල්ලගම ලිපිනයේ පිහිටා ඇති නිවස කටුගස්තොට පොලිස් වසමට අයත් වන්නකි.

මෙම පැමිණිල්ලට අදාළ සිද්ධිය සිදුවූ කාලවකවානුව තුළ රට තුළ සංචරණ සීමා පනවා තිබී ඇති බැවින්, සිද්ධිය 2021.06.14 දින සිදුවී ඇති නමුත්, පැමිණිලිකාර නිලංජනි දිල්රුක්ෂි යන අය ඒ පිළිබඳ පැමිණිල්ල ඉන් දින 03කට පසුව 2021.06.17 වන දින CIB II 102/86 යටතේ කටුගස්තොට පොලිස් ස්ථානයට සිදුකර ඇත. එසේ පැමිණිලි කළ ද එවකට පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැමිණිලිකාරිය හට ඇයගේ ස්වාමි පුරුෂයාගේ මව සිදු කළ පහරදීමට අදාළව ඇය රෝහල් ගතවී නොමැත.

පැමිණිලිකාර නිලංජනී දිල්රුක්ෂි විසින් ඇයගේ නැන්දම්මා වන පද්මිණි ජයවර්ධන යන අයට පහරදීම සම්බන්ධයෙන් පද්මිණි ජයවර්ධන යන අය සිදු කර තිබූ පැමිණිල්ල (CIB 3-332/132) 2021.06.16 දින කටුගස්තොට පොලිස් ස්ථානයේදී විභාග කරන අවස්ථාවේදී පැමිණිල්ලේ සඳහන් සිද්ධිය සිදුවී ඇත්තේ ගලගෙදර පොලිස් බල ප්‍රදේශයේ බැවින්, එය කටුගස්තොට පොලිස් බල ප්‍රදේශයට අයත් නොවන බවට පැමිණිලිකාර නීලංජනී දිල්රුක්ෂි ගීගනගේ යන අය විසින් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති නමුත්, එය පිළිනොගෙන පැමිණිල්ල විභාග කර ඇත.

පැමිණිලිකාරියගේ නැන්දම්මා විසින් පැමිණිලිකාරියට එරෙහිව 2021.06.14 වන දින කටුගස්තොට පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලේදී ඇයට රෝහල්ගතවීමට අවශ්‍ය නොවන බවටත් මින් ඉදිරියට මෙවැනි කරදර නොකරන ලෙසට පැමිණිලිකාරියට අවවාද කරන ලෙසට ඉල්ලා ඇතත්, 2021.06.16 වන දින එකී පැමිණිල්ලට අදාළව පොලිස් ස්ථානයේ පැවති පරීක්ෂණයයේදී මුල් පැමිණිල්ල සම්බන්ධයෙන් නීතිමය පියවර අවශ්‍ය බව දැනුම්දීමෙන් පසු අංක 350/21 දරණ අධිකරණ වෛද්‍ය පෝරමය පැමිණිලිකාරියගේ නැන්දම්මා හට නිකුත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාර නීලංජනි දිල්රුක්ෂි ගීගනගේ විසින් ඇයගේ නැන්දම්මා 2021.06.14 වන දින සිදු කර තිබූ පැමිණිල්ල කටුගස්තොට පොලිස් බල ප්‍රදේශයට අයත් නොවන බවට විරෝධතාවයක් නොදැක්වූ බවයි. එහෙත් පසුව මෙම පැමිණිල්ල 2021.07.01 වන දින ගලගෙදර පොලිස්ස්ථානයට යොමු කිරිම මඟින් පෙනි යන්නේ පැමිණිලිකාරිය විසින් එවැනි විරෝධතාවයක් මතුකර තිබියදී එය නොසලකා කටයුතු කර ඇති බවයි.

අදාළ පැමිණිලි විභාගයේදී පැමිණිලි පාර්ශවයෙන් පැමිණිලිකාරිය හැර වෙනත් කිසිදු අයෙකුට සහභාගිවීමට වගඋත්තරකාර පාර්ශවය ඉඩදී නොමැති අතර, පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයාගේ මව වන පද්මිණි ජයවර්ධන යන අයගේ පාර්ශවයෙන් පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයාගේ සහෝදරයාට ද සහභාගී වීමට අවස්ථාව සලසා දීම හේතුවෙන් ඒ පිළිබඳ පැමිණිලි පාර්ශවය විරෝධතා දක්වා ඇතත් එය නොසලකා හැර ඇත. කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී වගඋත්තරකරු විසින් එය තමන් අතින් සිදුවූ වැරැද්දක් බව පිළිගෙන ඇත. ඒ අනුව වගඋත්තරකරු විසින් පක්ෂග්‍රාහී බවකින් යුතුව අදාළ පැමිණිලි විභාගය සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

කටුගස්තොට පොලිස් ස්ථානයේදී 2021.06.16 දින සිදුකරන ලද පැමිණිලි විභාගයෙන් පසු එය සමථ මණ්ඩලයට යොමුකරන බවටත්, ඒ බව දෙපාර්ශවය වෙතම දැන්වූ බවටත් සටහන් යොදා ඇති නමුත්, සමථ මණ්ඩලයට යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ.

එලෙස උක්ත පැමිණිල්ල සමථ මණ්ඩලයට යොමු කරන බවට දෙපාර්ශවයට දන්වා තිබියදී 2021.06.28 දින අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 81 වගන්තිය යටතේ මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින්, පැමිණිලිකාරිය හා අනෙක් පාර්ශවය වන ඇයගේ ස්වාමි පුරුෂයා හා නැන්දම්මා අතර දිගින් දිගටම පවුල් ආරවුල් ඇතිවන බැවින් බරපතල සාමය කඩවීමක් සිදුවිය හැකි බැවින් බැඳුම්කරයට යටත් කරන ලෙස වගඋත්තරකරු විසින් දන්වා ඇත.

එහෙත් පැමිණිලිකාර නිලංජනී දිල්රුක්ෂි ගීගනගේ යන අයට එරෙහිව 81 වගන්තිය යටතේ අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමේදී ඇයට එරෙහිව ඇයගේ නැන්දම්මා වන පද්මිණි ජයවර්ධන යන අය විසින් ඉදිරිපත් කරන ලද 2021.06.14 දිනැති සී.අයි.බී. 03 332/232 දරණ පැමිණිල්ල හා ඩබ්ලිව්.සී.අයි.බී. 02 204/66 යටතේ පැමිණිලිකාරිය විසින් 2021.06.17 වන දින කටුගස්තොට

පොලිස් ස්ථානයට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව පෙනී යන්නේ පැමිණිලිකාරියට එරෙහිව එක් පැමිණිල්ලක් පමණක් තිබියදි 81 වගන්තිය යටතේ නඩුවක් ගොනු කිරීමට කටයුතු කර ඇති බවයි.

පැමිණිලිකාරියට එරෙහිව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ 81 වගන්තිය යටතේ අංක 32836/21 දරණ නඩුව ගොනු කිරීමේදී සඳහන් කර ඇති ඩබ්ලිව්.සී.අයි.බී. 02 204/66 දරණ පැමිණිල්ල පිළිබඳව සලකා බැලීමේදී තමන් හා ස්වාමි පුරුෂයා අතර ඇතිවන ආරවුල් නිරාකරණය කරගැනීම සඳහා දෙපාර්ශවයේ දෙමාපියන් කැඳවා ගැටළුවට විසඳුමක් ලබාදෙන ලෙස එකී පැමිණිල්ලෙන් පැමිණිලිකාරිය ඉල්ලා ඇති බව පෙනී යයි. එහෙත් එම පැමිණිල්ල විභාග කිරීමකින් තොරව ඇයට එරෙහිව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ 81 වගන්තිය යටතේ නඩු පැවරීමට වගඋත්තරකරු කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියට එරෙහිව ඇයගේ නැන්දම්මා වන පද්මිණි ජයවර්ධන යන අය විසින් සිදුකරන ලද සී. අයි.බී. 03 332/232 දරණ පැමිණිල්ල උපයෝගි කරගෙන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ 81 වගන්තිය යටතේ 2021.06.28 වන දින අධිකරණයට කරුණු වාර්තා කර තිබියදී නැවත එම පැමිණිල්ල කටුගස්තොට පොලිස් බල ප්‍රදේශයට අයත් නොවන බවට දක්වා 2021.07.01 වන දින එය ගලගෙදර පොලිස් ස්ථානය වෙත යොමු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර කටුගස්තොට පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා විසින් 2022.03.21 දින ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව මෙම පැමිණිලිකාරියට එරෙහිව ඇයගේ ස්වාමි පුරුෂයා වන ශ්‍යාමන් මධුසංඛ යන අය විසින් පවුල් ආරවුල් සම්බන්ධයෙන් පැමිණිලි 06ක් පමණ කටුගස්තොට පොලිස් ස්ථානය වෙත සිදුකර ඇති නමුත්, ඉන් පැමිණිලි 04ක්ම නැවත ඔහු විසින්ම ඉල්ලා අස්කර ගෙන ඇති බවත්, එක් පැමිණිල්ලක් සමථයට පත් කර ඇති බවත්, තවත් එක් පැමිණිල්ලක් සිවිල් අධිකරණයක් මගින් විසඳා ගන්නා ලෙසට උපදෙස් දී ඇති බවත් නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලිකාරිය විසින් සිදුකරන ලද පැමිණිලි 02ක්ද ඉල්ලා අස්කර ගැනිමක් හා සමථයට පත්කර ගැනිමක් සිදුකර ඇති බවත් පෙනී යයි. ඒ අනුව දෙපාර්ශවය අතර කිසිදු සාමය කඩවීමකට තුඩුදිය හැකි බරපතල සිදුවීමක් සිදුවී ඇති බවට අදාළ පැමිණිලි මගින් තහවුරු වී නොතිබියදි 81 වගන්තිය යටතේ නඩු පැවරීම යුක්ති සහගත නොවන බව ද පෙනි යයි.

ඉහත දක්වා ඇති පැමිණිලි හැර දෙපාර්ශවය විසින් වෙනත් කිසිඳු පැමිණිල්ලක් ඉදිරිපත් කර නොතිබියදී 81 වගන්තිය යටතේනඩු පැවරීම ගැටළු සහගත වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු අනුව සලකා බැලීමේදී පැමිණිලිකාරියට එරෙහිව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 81 වගන්තිය යටතේ අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමේදී පැමිණිලි දෙකක් පමණක් අදාළ කරගෙන ඇති බව පෙනී යයි. ඒ අතරින් පැමිණිලිකාරියගේ ස්වාමි

පුරුෂයාගේ මව (නැන්දම්මා) වන පද්මිණී ජයවර්ධන යන අය විසින් පැමිණිලිකාරියට එරෙහිව සිදුකරන ලද සී.අයි.බී. 03 332/132 පැමිණිල්ල, කටුගස්තොට පොලිස් ස්ථානයට අයත් නොවන පසුබිමකදී එය විභාග කර ඇති බවත්, එකී විභාගයේදි එම පැමිණිල්ල සමථ මණ්ඩලයට යොමු කරන බවට දෙපාර්ශවය වෙත උපදෙස් ලබා දී තිබියදී එසේ සිදු කර නොමැති බවත් අනාවරණය වේ.

අනෙක් පැමිණිල්ල ඩබ්ලිව්.සී.අයි.බී. 02 204/66 යටතේ පැමිණිලිකාරිය විසින් ඇයගේ නැන්දම්මාට එරෙහිව ගොනු කරන ලද පැමිණිල්ලකි. මෙම පැමිණිල්ලට අදාළව කිසිදු විභාගයක් පැවැත්වීමට වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර නැත.

ඒ අනුව දෙපාර්ශවය අතර සාමය කඩවීමට තරම් බරපතල සිදුවීම් සිදුවී නොමැති අවස්ථාවකදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 81 වගන්තිය යටතේ පැමිණිලිකාරියට එරෙහිව නඩු පැවරීමෙන් පැමිණිලිකාරියට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතුය යන පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර කටුගස්තොට පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කුලසේන යන අය විසින් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

වගඋත්තරකාර ප්‍රධාන පොලිස් පරීක්ෂක කුලසේන යන නිලධාරියා මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 11 . 27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව



පිටපත් අනෙක් පිටුවෙහි ඇත.

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය